# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021.04.21 |

## ජා.පා.මි.ද. මත පදනම් වූ උද්ධමනය 2021 මාර්තු මාසයේ දී ඉහළ යන ලදී

**මතුපිට උද්ධමනය**
- වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 5.1%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 5.3%
- මාසික වෙනස : -0.48%

**මූලික උද්ධමනය**
- වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 4.3%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.3%
- මාසික වෙනස : 0.4%

**ජා.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනසෙහි විචලනය**




**ජා.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2021 පෙබරවාරි මාසයේ පැවති සියයට 4.2හි සිට 2021 මාර්තු මාසයේ දී සියයට 5.1 දක්වා ඉහළ ගියේය. 2020 මාර්තු මාසයේ පැවති පහළ පදනම් අගය මගින් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා හේතු විය. මේ අතර, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 පෙබරවාරි මාසයේ දී පැවති සියයට 6.9හි සිට 2021 මාර්තු මාසයේ දී සියයට 8.8 දක්වා ඉහළ ගිය අතර ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 පෙබරවාරි මාසයේ පැවති සියයට 1.9හි සිට 2021 මාර්තු මාසයේ දී සියයට 2.0 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි දර්ශකයෙහි වෙනස, 2021 පෙබරවාරි මාසයේ පැවති සියයට 5.5හි සිට 2021 මාර්තු මාසයේ දී සියයට 5.3 දක්වා පහළ ගියේය.

2021 මාර්තු මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට -0.48ක් ලෙස වාර්තා වූ අතර, ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි සිදු වූ පහළ යෑම මේ සඳහා හේතු විය. තවද, 2021 මාර්තු මාසයේ දී ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල මාසික වෙනස්වීම් පිළිවෙළින්, සියයට -0.63ක් සහ සියයට 0.16ක් ලෙස වාර්තා විය. ඒ අනුව, 2021 මාර්තු මාසයේ දී ආහාර කාණ්ඩයේ, ප්‍රධාන වශයෙන්, එළවළු, අමු මිරිස්, සහ රතු ළූණු මිල ගණන්වල පහළ යෑමක් දක්නට ලැබුණි. මේ අතර, ප්‍රධාන වශයෙන්, ආපනශාලා සහ හෝටල් උප කාණ්ඩයේ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි ඉහළ යෑමක් 2021 මාර්තු මාසයේ දී වාර්තා විය.

තවද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය 2021 පෙබරවාරි මාසයේ දී පැවති සියයට 4.1හි සිට 2021 මාර්තු මාසයේ දී සියයට 4.3 දක්වා ඉහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2021 පෙබරවාරි මාසයේ දී පැවති සියයට 4.2හි සිට 2021 මාර්තු මාසයේ දී සියයට 4.3 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

---

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

## දත්ත ඇමුණුම

### සංඛ්‍යා සටහන 1 : ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2019 | ජනවාරි | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 | 1.8 | 2.7 |
| | පෙබරවාරි | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 | 1.7 | 3.0 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 | 1.7 | 3.3 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 | 1.9 | 3.7 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 | 2.0 | 4.0 |
| | ජූනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 | 2.0 | 4.4 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 | 1.9 | 4.7 |
| | අගෝස්තු | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 | 2.0 | 5.0 |
| | සැප්තැම්බර් | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 | 2.3 | 5.2 |
| | ඔක්තෝබර් | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 | 2.8 | 5.4 |
| | නොවැම්බර් | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 | 3.0 | 5.6 |
| | දෙසැම්බර් | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 | 3.5 | 5.7 |
| 2020 | ජනවාරි | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 | 4.1 | 5.6 |
| | පෙබරවාරි | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 | 4.5 | 5.5 |
| | මාර්තු | 135.2 | 136.0 | -1.3 | 0.1 | 7.0 | 3.2 | 4.9 | 5.2 |
| | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 | 5.1 | 5.0 |
| | මැයි | 135.4 | 137.9 | 0.4 | 0.7 | 5.2 | 3.7 | 5.2 | 4.8 |
| | ජූනි | 137.3 | 138.9 | 1.4 | 0.7 | 6.3 | 4.4 | 5.6 | 4.6 |
| | ජූලි | 137.3 | 139.4 | 0.0 | 0.4 | 6.1 | 4.5 | 5.9 | 4.5 |
| | අගෝස්තු | 137.8 | 139.9 | 0.4 | 0.4 | 6.2 | 4.6 | 6.1 | 4.4 |
| | සැප්තැම්බර් | 138.9 | 140.4 | 0.8 | 0.4 | 6.4 | 4.8 | 6.2 | 4.3 |
| | ඔක්තෝබර් | 139.1 | 140.5 | 0.1 | 0.1 | 5.5 | 4.5 | 6.2 | 4.2 |
| | නොවැම්බර් | 139.8 | 140.6 | 0.5 | 0.1 | 5.2 | 4.5 | 6.3 | 4.2 |
| | දෙසැම්බර් | 141.2 | 140.5 | 1.0 | -0.1 | 4.6 | 4.7 | 6.2 | 4.1 |
| 2021 | ජනවාරි | 142.1 | 141.0 | 0.6 | 0.4 | 3.7 | 4.2 | 5.8 | 4.2 |
| | පෙබරවාරි | 142.8 | 141.3 | 0.5 | 0.2 | 4.2 | 4.1 | 5.5 | 4.2 |
| | මාර්තු | 142.1 | 141.8 | -0.5 | 0.4 | 5.1 | 4.3 | 5.3 | 4.3 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව